# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1571/15 - 2008 ඔක්තෝබර් 16 වැනි බ්‍රහස්පතින්දා - 2008.10.16

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78 V.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වැනි වගන්තිය සමග කියවිය යුතු 24අ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2008 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2008 අංක 2 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි - තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2008 අගෝස්තු මස 25 දින සිට බලාත්මක වන්නේ ය.

2. මේ නියමාවලිය 2008 ඔක්තෝබර් 10 දින අංක 1570/34 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ සාදන ලද නියෝගය මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන ) කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි - තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනයට අදාල වන්නේ ය.

3. ආයතනය (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන ) කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

4. පනතේ විධිවිධානවලට සහ (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව, ආයතනය වෙත පහත සඳහන් කටයුතු සඳහා බලය ඇත්තේ ය.

1A - G 010343 — 940 (2008/10)

(අ) සිසුන් ඇතුළත් කර ගැනීමට ;

(ආ) කෘෂි - තාක්ෂණික , කෘෂි - ව්‍යාපාරික සහ ග්‍රාමීය විද්‍යා ක්ෂේත්‍රවලට අදාල පාඨමාලා පැවැත්වීම ;

(ඇ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි යම් කෘෂි - තාක්ෂණික , කෘෂි - ව්‍යාපාරික සහ ග්‍රාමීය විද්‍යා ශාඛා සඳහා නියෝග කිරීම, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය සහ උපදෙස් දීම ;

(ඈ) කෘෂි- තාක්ෂණික, කෘෂි - ව්‍යාපාරික සහ ග්‍රාමීය විද්‍යා පිළිබඳ ප්‍රවීනතාවය ලබා ඇත්තේ කවර තැනැත්තන් ද යන්න විමසා බැලීමේ කාර්ය සඳහා එවැනි තැනැත්තන්හට විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව, විභාග පැවැත්වීම සහ එවැනි විභාග සමත් තැනැත්තන්ට සහ අනු නීති මගින් නියමකර ඇති වෙනත් කොන්දේසි සපුරා ඇති බවට සෑහීමට පත් වීමෙන් පසු විශ්වවිද්‍යාලයේ උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා යෝග්‍ය බවට විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම ;

(ඉ) විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව සහ අවශ්‍ය අවස්ථාවලදී කොමිෂන් සභාවේ එකගත්වය ඇතිව, කෘෂි - තාක්ෂණික, කෘෂි - ව්‍යාපාරික සහ ග්‍රාමීය විද්‍යා සහ ආශ්‍රිත තාක්ෂණික විද්‍යා පිළිබඳ පිරිනැමිය යුතු උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ වෙනත් අධ්‍යයන කුසලතා තීරණය කිරීම;

(ඊ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශීය විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ ගුරුවරුන්, සිසුන් සහ ශාස්ත්‍රධාරීන් හෝ වෙනත් ආකාරයක හුවමාරු කර ගැනීමෙන් සහයෝගය දැක්වීම ;

(උ) සමත් වී ඇති විභාග සහ විශ්වවිද්‍යාලවල දී අනුගමනය කළ යුතු ඉගැන්වීමේ හෝ අධ්‍යයන කිරීමේ කාලසීමා සහ විශ්වවිද්‍යාල මට්ටමේ ඉගෙනීම් ස්ථාන, නීතිය මගින් නියම කරනු ලැබිය හැකි එකී විභාගවලට සමාන විභාග පවත්වන ආයතන සහ ආයතනයේ ඉගැන්වීමේ හෝ අධ්‍යයනය කිරීමේ කාලසීමාව හෝ ඉන් යම් කොටසක් පිළිගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව වෙත නිර්දේශ කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී නීතිය මගින් නියම කර ඇති ආකාරයට එකී පිළිගැනීම ඉවත් කිරීම ;

(ඌ) විශ්වවිද්‍යාලයේ එකගත්වය සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, අධ්‍යයන මණ්ඩල පිහිටුවීම නිශ්චය කිරීම ;

(එ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි උපදේශක, පුහුණු, පර්යේෂණ, සංවර්ධන හෝ උපදේශන කාර්ය සඳහා අවශ්‍ය පුස්තකාල, විද්‍යාගාර සහ වෙනත් ගොඩනැගිලි විශ්වවිද්‍යාලයේ එකගත්වය ඇතිව ඉදිකිරීම, පහසුකම් සැලසීම සහ පවත්වාගෙන යාම ;

(ඒ) ආයතනයේ කාර්ය සඳහා යම් ඉගැන්වීමේ, පරිපාලනමය සහ වෙනත් තනතුරු ඇති කිරීම සඳහා සහ එකී තනතුරු තහනම් කිරීම හෝ අත්හිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීමට විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම ;

(ඔ) විශ්වවිද්‍යාලය විමසා, අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම ;

(ඕ) තත්කාර්ය සඳහා අතුරු ව්‍යවස්ථා මගින් නියම කරන ලද විධිවිධාන ප්‍රකාරව ආයතනයෙන් පිටත ස්ථානවල දී අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලාවලින් කොටසක් පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කිරීම ;

(ක) යම් දෙන ලද කාලයක දී රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාර ගාස්තු ඉල්ලා සිටීම සහ ගාස්තු ලබා ගැනීම සහ එකී ගාස්තු ගෙවීම සඳහා නියම කරන ලද රීති ප්‍රකාරව එම ගාස්තු ඉල්ලා සිටීම සහ ලබාගැනීම ;

(ග) ආයතනයේ අරමුණු වැඩිදියුණු කිරීම සඳහා ඉහත කී බලතල, කාර්ය සහ කර්තව්‍යවලට ආනුෂාංගික හෝ ඒ හා සම්බන්ධ වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

5. ආයතනය පහත සඳහන් දෑ වලින් සමන්විත විය යුතු ය:—

(i) (නියමාවලියේ මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන ) කළමනාකරණ මණ්ඩලය ;
(ii) ශාස්ත්‍රීය මණ්ඩලය ;
(iii) අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල ;
(iv) අධ්‍යයන අංශ ;
(V) මධ්‍යස්ථාන ; සහ
(vi) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් ආයතන.

6. ආයතනයට පහත සඳහන් නිලධරයන් සිටිය යුතු ය :—

(i) අධ්‍යක්ෂ ;
(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ ; සහ
(iii) මේ ඡේදයේ කාර්ය සඳහා තනතුර දරනු ලබන තැනැත්තා නිලධරයකු විය යුතු තනතුරක් වන නියමාවලිය මගින් ප්‍රකාශයට පත්කරන ලද වෙනත් යම් තනතුරක් දරන්නකු,

7. (1) ආයතනයේ පළමු අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ නිර්දේශය මත (මෙහි මින්මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන ) විශ්වවිද්‍යාලයේ සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය. ඉන්පසු සෑම අධ්‍යක්ෂවරයකුම, ආයතනයේ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තුන්දෙනකුගෙන් යුත් මණ්ඩලයක් අතරින් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, කිසිම තැනැත්තකු අධ්‍යක්ෂවරයා වශයෙන් නොකඩවා දෙවරකට වඩා වැඩි වාර ගණනක් සඳහා පත් කරනු නොලැබිය යුතු ය.

එසේම තවදුරටත්, අධ්‍යක්ෂවරයා පත්කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබාගත යුතු ය.

(2) ආයතනයේ සභාපතිවරයා කලින් ධූරය හිස්කරනු ලබයි නම් හෝ (3) වැනි උපඡේදයේ විධිවිධාන දක්වා ඇති ආකාරයට ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, තමාගේ පත්වීමේ දිනයෙන් ආරම්භ වන අවුරුදු තුනක කාලයක් සඳහා හෝ තමා වයස අවුරුදු හැට පහ සම්පූර්ණ කරන තෙක් සහ දෙකෙන් කලින් සිදුවන කාලය සඳහා ධූර දැරිය යුතු ය.

(3) දෝෂාරෝපන යෝජනාවක් සම්මත කිරීම සඳහා පවත්වන ලද විශේෂ ඡන්ද විමසීමකින් පසු මුළු සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් එකී යෝජනාව සම්මත වීමෙන් පසු සභාව විසින් හේතු දක්වා අධ්‍යක්ෂවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එකී රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් අධ්‍යක්ෂවරයා හැර තමන් අතරින් එක් තැනැත්තකු එම රැස්වීමේ මූලසුන සඳහා තෝරාගත යුතු ය.

(4) ධූරයෙන් ඉල්ලා අස්වූ හෝ ධූරයෙන් ඉවත් කරන ලද අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයා වශයෙන් පත්කරනු ලැබීමට ඉහතින්ම උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු පනතේ දැක්වෙන විශ්‍රාම ගැනීමේ වයසට එළඹී නොමැති නම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහු පෙරළා පැමිණිය යුතු ය.

(5) අධ්‍යක්ෂවරයා රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට ධූරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකිරීම සඳහා උපකුලපතිවරයා විසින් වහාම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පත්කරනු ලැබිය යුතු ය.

(6) අධ්‍යක්ෂ ධූරයෙහි යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත, අධ්‍යක්ෂ ධූරයේ කාර්ය ඉටුකිරීම සඳහා සුදුසු යැයි උපකුලපතිවරයා අදහස් කරනු ලබන වැඩපිළිවෙළක් යෙදිය හැකි ය. එවැනි වැඩපිළිවෙළක් යොදන තෙක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ ධූරයේ කාර්යය ඉටු කරනු ලැබිය යුතු ය.

8. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු නිලබලයෙන් ආයතනයේ මණ්ඩලයේ, ආයතනයේ ශාස්ත්‍රීය කමිටුවේ සහ සියලු අධ්‍යයන මණ්ඩලවල සාමාජිකයෙකු වන්නේ ය. ආයතනයේ වෙනත් යම් බලමණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සිටීමට සහ ඒ රැස්වීමේ කථා කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකම් ඇති නමුත් ඔහු ඒ වෙනත් බලමණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකවකු වන්නේ නම් මිස, ඒ යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා නීතිඥානුකූලව තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධිවිධානවලට අනුකූලව, නියමාවලියේ, පනතේ හෝ වෙනත් යම් සාධන පත්‍රයක විධිවිධාන ආයතනයට අදාල වනතාක් දුරට, එකී විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්ය විය යුතු අතර ඒ කාර්ය සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම අධ්‍යක්ෂවරයාගේ කාර්ය විය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන් තැබීමේ නිලධරයා වන්නේ ය.

(5) විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ විධානය යටතේ ආයතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිය යුතු ය. විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා නොමැති නම්, විශ්වවිද්‍යාලයේ උචිත අතුරු ව්‍යවස්ථා සහ වෙනත් රීති ඊට අදාළ කරගනු ලැබිය යුතු ය.

9. (1) සභාව විසින් මණ්ඩලයේ නිර්දේශ මත ආයතනයේ ආශ්‍රිත මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් අතුරින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පත්කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස කිසිම තැනැත්තකු නොකඩවා දෙවරකට වැඩි වාර ගණනක් සඳහා පත්කරනු නොලැබිය යුතු ය.

(2) (1) වැනි ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවීමෙන් පසු සහ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම කිරීමෙන් පසු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පත්කර ගැනීම සඳහා වූ නිර්දේශ මණ්ඩලය වෙත කරනු ලැබිය යුතු ය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුක්තය, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(3) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කලින් ධුරය අත්හැරියහොත් හෝ (4) වැනි උපවගන්තිය මඟින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත්කරනු ලබන දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලසීමාවක් ගතවීම හෝ වයස අවුරුදු හැටපහ සම්පූර්ණවීම යන මෙයින් කලින් එළඹෙන දිනය තෙක් ධුරය දැරිය යුතු ය.

(4) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී එම මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් හේතු දක්වා සම්මත කරගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පාලක සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(5) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය.

10. මණ්ඩලය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය විය යුතු අතර පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː—

(1) නිලබලයෙන් පත්වන සාමාජිකයන් පස්දෙනෙකු, එනම් :—

(අ) සභාපති විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා;

(ඇ) උසස් අධ්‍යාපන විෂයය භාර ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ උසස් අධ්‍යාපන විෂය පවරා ඇති වෙනත් යම් අමාත්‍යාංශයක ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ඈ) කෘෂිකර්ම විෂය භාර ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ; සහ

(ඉ) විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ; සහ

(2) වෙනත් සාමාජිකයන් හය දෙනෙකු, එනම් :—

(අ) කෘෂි - තාක්ෂණ සහ කෘෂි - ව්‍යාපාර කර්මාන්ත අංශ නියෝජනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයන් දෙදෙනකු ;

(ආ) සභාව විසින් සිය සාමාජිකයින් අතරින් පත්කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(ඇ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු ;

(ඈ) ශාස්ත්‍රීය මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතරින් පත්කරනු ලබන එක් සාමාජිකයකු

11. (1) අධ්‍යක්ෂවරයා, මණ්ඩලයේ සෑම රැස්වීමකට මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට අධ්‍යක්ෂවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට, අධ්‍යක්ෂවරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා යන දෙදෙනාම පැමිණ නොසිටින අවස්ථාවක දී මණ්ඩලයේ සාමාජිකයන් විසින් පැමිණ සිටින සාමාජිකයන් අතරින් එක් අයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කරනු ලැබිය යුතු ය.

(2) යම් නම්කල හෝ පත්කළ සාමාජිකයෙකු තමා කලින් ධුරය හිස්කරන්නේ නම් මිස, තමා පත්කළ හෝ නම් කළ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා සාමාජිකයෙකු වශයෙන් ධුර දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත නම් කිරීමට, නැවත තෝරා ගැනීමට හෝ නැවත පත්කිරීමට සුදුසු වන්නේ ය.

එසේ වුවද , යම් නම්කළ හෝ පත්කළ සාමාජිකයකු තමාගේ කාලසීමාව අවසන් වීමට පෙර ධුරය හිස් කරනු ලබයි නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයා තමා කලින් ධුරය හිස් කරනු ලබයි නම් මිස තමාගේ පූර්වගාමියාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

එසේ ම තවදුරටත් යම් නම්කළ හෝ පත්කළ සාමාජිකයකු තමා මණ්ඩලයේ සාමාජිකයකුව වරප්‍රසාද විඳින තාක්කල් ධුර දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් නම්කළ හෝ පත්කළ සාමාජිකයෙකු අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාව හෝ උපකුලපතිවරයා අමතන ලද ලිපියක් මගින් සහ ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වූ පිටපතක් සමග ඔහු පත්කළ සංස්ථාවේ සභාපතිවරයා අමතා යවනු ලබන ලියවිල්ලක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයෙකු නොපැමිණීම පිළිබඳ නිවාඩු නොමැතිව මණ්ඩලයේ අඛණ්ඩව රැස්වීම් වාර තුනකට සහභාගිවීමට අපොහොසත් වුවහොත් ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තම ධුරය හිස්කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර පත්වීම් බලධරයා විසින් නියමාවලියේ විධිවිධාන ප්‍රකාරව එකී පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසු තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ සෑම නම්කළ හෝ පත්කළ සාමාජිකයකු වෙත ම කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය මණ්ඩලයේ සමස්ථ සාමාජිකත්වයෙන් තුනෙන් එකක් විය යුතුය.

(7) මණ්ඩලය අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී රැස්විය යුතු ය. එසේ වුව ද, සෑම වසරකම මණ්ඩලය වාර අටකට අඩු නොවන වාර ගණනක් රැස්විය යුතු ය.

(8) සභාපතිවරයා විසින් තමාට අවශ්‍ය බවට පෙනීයන ඕනෑම අවස්ථාවක දී, මණ්ඩලයේ මුළු සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට අඩු නොවන සාමාජිකයන් ගණනක් විසින් ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් ලැබී සතියක කාලයක් ඇතුලත මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය. එවැනි විශේෂ රැස්වීමක් සඳහා වූ අරමුණ එකී ඉල්ලීමේ නිශ්චිතව සඳහන් විය යුතු ය.

12. (1) පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත් ව, පහත සඳහන් බලතල මණ්ඩලයට ඇත්තේ ය:—

(අ) ආයතනයේ චංචල හෝ නිශ්චල දේපළ දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන ප්‍රකාරව ආයතනය හා සම්බන්ධ සියලු කාරණා ක්‍රමවත් කිරීම සහ නිශ්චය කිරීම ;

(ඇ) ආයතනයේ පොදු පරිපාලනය සහ කළමනාකරණය සඳහා මෙන් ම වෙනත් යම් නිශ්චිත කාර්ය සඳහා ආයතනයේ අරමුදල් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම ;

(ඈ) ආයතනය වෙත ලබාදෙන ලද රික්තවරණ, පරිත්‍යාග සහ වෙනත් චංචල හෝ නිශ්චල ප්‍රදාන කොමිෂන් සභාවේ එකගත්වය ඇතිව ලබාගැනීම සහ භාර ගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් සහ ශේෂපත්‍රය අධීක්ෂණය කිරීම සහ විශ්වවිද්‍යාලය සහ කොමිෂන් සභාව වෙත එකී වාර්තා සහ එකී ගිණුම් භාරදීම ;

(ඊ) මුදල් වර්ෂය සහතික කිරීම සඳහා ආයතනයේ ඇස්තමේන්තු පිළියෙළ කිරීම හෝ පිළියෙළ කිරීමට සැලැස්වීම සහ එම ඇස්තමේන්තු අනුමත වූ පසු විශ්වවිද්‍යාලය සහ කොමිෂන් සභාව වෙත එම ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම ;

(උ) ශාස්ත්‍රීය මණ්ඩලය විමසා විශ්වවිද්‍යාලය වෙත—

(i) අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රදානය කරනු ලැබිය යුතු උපාධි, ඩිප්ලෝමා, සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන සම්මාන ;

(ii) හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණුවීම්, සමත් විය යුතු විභාග සහ එකී සහතික පත්‍ර සහ වෙනත් අධ්‍යයන සම්මාන සඳහා සුදුසුකම් ලැබීමට බලාපොරොත්තු වන සිසුන් විසින් සපුරාලිය යුතු කොන්දේසි ;

*නිර්දේශ කිරීම* :—

(ඌ) අතුරු නීති හෝ රීති සෑදීම සඳහා බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අතුරු නීති හෝ රීති සෑදීම ;

එසේ වුවද, ශාස්ත්‍රීය මණ්ඩලයෙන් ලැබෙන වාර්තා සලකා බැලීමෙන් පසුව හැර අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් කිසිම අතුරු නීතියක් හෝ රීතියක් සාදනු නොලැබිය යුතු ය ;

(එ) ආයතනයේ වැඩ කරගෙන යෑම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි පරිශ්‍ර, ගෘහ භාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඒ) විශ්වවිද්‍යාලය විමසා—

(i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන ඉගැන්වීමේ සහ පරිපාලනමය තනතුරු ඇතුලු තනතුරු ඇති කිරීම සහ එකී තනතුරු තහනම් කිරීම හෝ අත්හිටුවීම සඳහා ;

(ii) ආයතනය වෙත බඳවා ගතයුතු ගුරුවරුන් , නිලධරයන් සහ වෙනත් සේවකයන් විසින් ලබා සිටිය යුතු සුදුසුකම්;

(iii) ආයතනයේ ගුරුවරුන් සහ පරීක්ෂකවරුන් ලෙස බඳවා ගැනීම සඳහා සුදුසු තැනැත්තන් ;

*කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීම* :

(ඔ) ආයතයේ සේවා නියුක්තිකයන් අත්හිටුවීම, සේවයෙන් පහකිරීම සඳහා හෝ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සඳහා අවශ්‍ය සුදුසු පියවර ගැනීම ;

(ඕ) ආයතනයකට යෝග්‍ය බවට පෙනී යන ස්ථාවර කමිටු සංඛ්‍යාවක් හෝ තත්කාර්යය කමිටු සංඛ්‍යාවක් පත්කිරීම ; සහ ඔවුන්ගේ සේවා කොන්දේසි නියම කිරීම ; එකී කමිටුවල වාර්තා සලකා බැලීම සහ එකතු කිරීමක් සහිතව හෝ රහිතව එම වාර්තා අනුමත කිරීම හෝ එකී වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ක) විශේෂ පැවරුම් සඳහා යෝග්‍ය වන තැනැත්තන්ගේ සේවය ඉල්ලා සිටීම හෝ ආයතනයට අනුබද්ධ කරගැනීම සඳහා උචිත විශ්වවිද්‍යාලයේ යම් අධ්‍යයන අංශයක සේවය කරන තැනැත්තන්ගේ සේවය ඉල්ලා සිටීම ;

(ග) පනතේ 15 වැනි වගන්තියේ (vii) වැනි ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් තෝරාගනු ලබන සිසුන් හැර අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම සහ ඇතුළත් කර ගැනීම සඳහා වූ නිර්නායක, ශාස්ත්‍රීය මණ්ඩලය විමසා විශ්වවිද්‍යාලයේ සහ කොමිෂන් සභාවේ එකගත්වය ඇතිව නිශ්චය කිරීම ;

(ජ) භාර ආඥාපනතේ 20 වැනි වගන්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව යම් ව්‍යාවහාරික නොවන ආදායමක් ද ඇතුලු ආයතනයට අයත් යම් මුදලක් ආයෝජනය කිරීම ; භාර මුදල් ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය ; එමෙන් ම කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව, ශ්‍රී ලංකාවේ යම් නිශ්චල දේපලක් මිළ දී ගැනීම සඳහා යම් මුදල් ආයෝජනය කිරීම හෝ එකී ආයෝජන වෙනස් කිරීම හෝ වහා වියදම් කිරීම සඳහා අවශ්‍ය නොවන එකී මුදල්වලින් යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද යම් බැංකුවක ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීම ; සහ

(ට) මේ නියමාවලියේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන සලස්වා ඇති ආකාරයට ආයතනයේ බලතලවලට ආනුෂංගික හෝ සම්බන්ධිත ආයතනයේ සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(2) ශාස්ත්‍රීය මණ්ඩලය විසින් යම් අධ්‍යයන කරුණක් පිළිබඳව වාර්තා කිරීම සඳහා මණ්ඩලය වෙත අවස්ථාවක් පළමුව ලබා දී ඇත්නම් සහ ඒ පිළිබඳ ස්වකීය මතය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස, මණ්ඩලය විසින් යම් අධ්‍යයන කරුණක් පිළිබඳව කිසිම යෝජනා සම්මතයක් සම්මත කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, එසේ සම්මත කරගනු ලැබූ කිසිම යෝජනා සම්මතයක්, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස ක්‍රියාත්මක නොකළ යුතු ය.

මේ ඡේදයේ “අධ්‍යයන කාරණය” යන්නෙන් ශාස්ත්‍රීය මණ්ඩලයේ පාලනය සහ සාමාන්‍ය විධානයට යටත් වන යම් කාරණයක් අදහස් වේ.

13. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන ශාස්ත්‍රීය මණ්ඩලයක් තිබිය යුතු ය:—

(අ) සභාපති විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) සෑම අධ්‍යයන අංශයකම අංශ ප්‍රධානීන් ;

(ඇ) කෘෂිකර්ම සහ වාරිකර්මාන්ත අමාත්‍යාංශවල ලේකම්වරුන් විසින් නම් කරන ලද පිළිවෙලින් වූ අමාත්‍යාංශ නියෝජනය කිරීම සඳහා නිලධරයන් දෙදෙනෙකු ;

(ඈ) එක් එක් අධ්‍යයන අංශ විසින් නම් කරන ලද සාමාජිකයකු ;

(ඉ) සෑම එක් එක් පාඨමාලා සඳහා වූ සම්බන්ධීකරණ නිලධරයන් ;

(ඊ) ආයතනයේ එක් එක් අධ්‍යයන අංශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් සහ ආශ්‍රිත මහාචාර්යවරුන් ;

(උ) ඉහත (ඊ) යටතට නොගැනෙන සාමාජිකයින් වන ඉගැන්වීමේ නිරත වී සිටින ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය අතරින් තෝරාගනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

(2) ශාස්ත්‍රීය මණ්ඩලය විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව යම් නිශ්චිත කාර්යයක් සඳහා සහ යම් නිශ්චිත කාලසීමාවක් සඳහා එක් තැනැත්තකු හෝ තැනැත්තන් කිහිපදෙනෙකු සම්බන්ධ කරගනු ලැබිය හැකි නමුත් එසේ සම්බන්ධ කරගනු ලැබූ කිසිම තැනැත්තකු හට තෝරා ගැනීමක් සඳහා ඉදිරිපත් වීමට හෝ ශාස්ත්‍රීය මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීමට අයිතියක් නැත්තේ ය.

(3) ශාස්ත්‍රීය මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය, යම් සම්බන්ධ කරගත් සාමාජිකයන් ඇත්නම් ඔවුන් බැහැර කිරීමෙන් පසුව මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකකට නොඅඩු විය යුතු ය.

(4) ශාස්ත්‍රීය මණ්ඩලය අවශ්‍ය සෑම අවස්ථාවක දී ම රැස්විය යුතු නමුත්, සෑම වසරකම සැසිවාර හයකට අඩු නොවන වාර ගණනක් රැස්විය යුතු ය.

14 (1) පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල වෙත ආයතනයේ උපදේශන, පුහුණු, පර්යේෂණ, සහ විභාග සම්බන්ධයෙන් පාලනය සහ සාමාන්‍ය විධානය ඇත්තේ ය.

(2) (1) වැනි උපඡේදය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, ශාස්ත්‍රීය කමිටුව විසින් පහත සඳහන් දෑ සිදු කරනු ලබන්නේ ය :—

(අ) මණ්ඩලය විසින් තමා වෙත යොමු කරන ලද යම් කරුණක් සලකා බැලීම සහ වාර්තා කිරීම ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීම් වැඩ සටහන්, පුහුණු වැඩ සටහන්, පර්යේෂණ වැඩසටහන් හෝ විභාග හා සම්බන්ධ නොවන කාරණා පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂය පිළිබඳව සලකා බැලීම සහ වාර්තා කිරීමේ කාර්ය සඳහා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් සමන්විත කමිටු පත්කිරීම ;

(ඈ) මණ්ඩලය වෙත—

(i) අධ්‍යයන පාඨමාලා සහ විභාග සඳහා ඇතුල්වීමේ යෝග්‍යතා ;

(ii) ගුරුවරුන් හෝ පරීක්ෂකවරුන් වශයෙන් පිළිගැනීම සඳහා යෝග්‍යවන තැනැත්තන් ;

(iii) නිර්දේශිත විභාග සමත් සහ වෙනත් නිර්දේශිත තත්ත්වයන් සපුරා ඇති උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ වෙනත් අධ්‍යයන කුසලතා පිරිනැමීම සඳහා යෝග්‍ය තැනැත්තන් ;

(iV) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර,පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා වූ ක්‍රමවේදය සහ කොන්දේසි ;

(V) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග පිරිනැමිය යුතු තැනැත්තන්ගේ නම් ;

නිර්දේශ කිරීම ; සහ

(ඉ) මේ නියමාවලියේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන සලස්වා ඇති ආකාරයට ආයතනයේ බලතල හා සම්බන්ධ හෝ ආනුෂංගික අධ්‍යයන කාරණා සම්බන්ධයෙන් වූ ආයතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

15. (අ) පර්යේෂණ සහ උසස් උපාධි ;

(ආ) අභ්‍යන්තර අධ්‍යයන වැඩසටහන් ;

(ඇ) බාහිර සහ දීර්ඝ කරන ලද වැඩසටහන්

සම්බන්ධයෙන් අධ්‍යයන මණ්ඩල තිබිය යුතු ය.

16. පර්යේෂණ සහ උසස් උපාධි සම්බන්ධයෙන් පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත අධ්‍යයන මණ්ඩල තිබිය යුතු ය:—

(අ) සභාපති විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) සෑම අධ්‍යයන අංශයකම අංශ ප්‍රධානියා ;

(ඇ) සෑම මධ්‍යස්ථානයකම සම්බන්ධීකරණ නිලධාරීන් හෝ ඔවුන්ගේ නාමිකයන් ;

(ඈ) එක් එක් අධ්‍යයන අංශය විසින් නම් කරන ලද එක් නියෝජිතයකු සහ පර්යේෂණ සහ සංවර්ධන හෝ පශ්චාත් උපාධි ඉගැන්වීමේ නිරතව සිටින එක් එක් මධ්‍යස්ථානයෙන් එක් අයෙකු ; සහ

(ඉ) එක් එක් හඳුනාගත් වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ශාස්ත්‍රීය මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජිකයන්.

17. (1) අභ්‍යන්තර අධ්‍යයන වැඩසටහන් සම්බන්ධයෙන් වූ අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය:—

(අ) සභාපති විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) සෑම අධ්‍යයන අංශයකම අංශ ප්‍රධානියා ;

(ඇ) වර්තමාන සේවක ප්‍රමාණයේ සියලු ගුරුවරුන් ;

(ඈ) කෘෂි - තාක්ෂණය හා සම්බන්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ව්‍යවසාය නියෝජනය කරනු ලබන මණ්ඩලය විසින් පත්කරන ලද නාමිකයන් දෙදෙනෙකු ; සහ

(ඉ) ආයතනයේ ලියාපදිංචි වී සිටින උපාධි අපේක්ෂක අභ්‍යන්තර සිසුන් අතරින් තෝරා පත්කරගත් සිසුන් දෙදෙනකු.

(2) (1) වැනි ඡේදයේ (ඉ) උපඡේදය යටතේ තෝරාගනු ලැබූ සාමාජිකයන් එක් අධ්‍යයන වර්ෂයක කාලයක් සඳහා සාමාජිකයකු ලෙස ධුර දැරිය යුතු නමුත් එවැනි සාමාජිකයකු අභ්‍යන්තර උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙකු ලෙස දිගටම ලියාපදිංචි ව සිටිය යුතුය. විභාග හෝ ඒ හා සම්බන්ධ කාරණා සාකච්ඡා කිරීම පිණිස පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම්වලින් ඉහත කී ආකාරයට තෝරා පත්කර ගන්නා ලද සාමාජිකයන් බැහැර කළ යුතුය. එවැනි රැස්වීම්, එවැනි බැහැර කිරීමක කුමක් සඳහන් වුවද, යථාපරිදි පවත්වන ලද ලෙසට සලකනු ලැබිය යුතුය.

18. බාහිර සහ දීර්ඝ කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් වූ අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය:—

(අ) සභාපති විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) සෑම එක් එක් මධ්‍යස්ථානයකම සම්බන්ධීකරණ නිලධාරීන් හෝ ඔවුන්ගේ නාමිකයන් ;

(ඇ) සෑම එක් එක් අධ්‍යයන අංශයකින්ම එක් නාමිකයකු ;

(ඈ) එක් එක් හඳුනාගත් වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ශාස්ත්‍රීය මණ්ඩලය විසින් පත්කරන ලද සාමාජිකයන්.

19. (1) ශාස්ත්‍රීය මණ්ඩලයේ එකඟත්වය ඇතිව සෑම අධ්‍යයන මණ්ඩලයක් විසින් ම යම් නිශ්චිත කාර්යයක් සඳහා සහ යම් නිශ්චිත කාලසීමාවක් සඳහා එක් තැනැත්තකු හෝ තැනැත්තන් කිහිපදෙනකු සම්බන්ධ කරගනු ලැබිය හැකි නමුත් එසේ සම්බන්ධ කරගනු ලැබූ කිසිම තැනැත්තකුට තෝරාගැනීමක් සඳහා ඉදිරිපත් වීමට හෝ අධ්‍යයන මණ්ඩලයේ යම් රැස්වීමකදී ඡන්දය පාවිච්චි කිරීමට අයිතියක් නොතිබිය යුතුය.

(2) අධ්‍යයන මණ්ඩලයේ ගණපූරණය, යම් සම්බන්ධ කරගත් සාමාජිකයන් සිටී නම්, ඔවුන් බැහැර කිරීමෙන් පසු මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකකට අඩු නොවන අවම ප්‍රමාණයක් විය යුතුය.

(3) සෑම අධ්‍යයන මණ්ඩලයක් ම අවශ්‍ය සෑම අවස්ථාවක දී ම රැස්විය යුතු නමුත් සෑම වසරකම සැසිවාර දහයකට අඩු නොවන වාරගණනක් අධ්‍යයන මණ්ඩලය රැස්විය යුතුය.

20. (අ) කෘෂි - තාක්ෂණික ;

(ආ) ආහාර තාක්ෂණික ;

(ඇ) ව්‍යවසායකත්ව, කෘෂි - ව්‍යාපාර සහ ග්‍රාමීය විද්‍යාවේ

මූලිකාංග සම්බන්ධයෙන් වූ අධ්‍යයන අංශ තිබිය යුතුය.

21. (1) සෑම අධ්‍යයන අංශයකම, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු විය යුතු අංශ ප්‍රධානියකු සිටිය යුතුය. සෑම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතුය.

(2) අංශ ප්‍රධානියා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, තම පත්කිරීමේ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත්කිරීම සඳහා සුදුසු විය යුතුය.

(3) සෑම අංශ ප්‍රධානියකු වෙතම මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ලැබිය යුතුය.

(4) යම් අංශ ප්‍රධානියකු නිවාඩු ලබා ගැනීම, රෝගාතුරවීම හෝ වෙනත් හේතුවක් නිසාවෙන් ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීම සඳහා මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා අපොහොසත්වන අවස්ථාවක, එකී කාලය සඳහා එම අංශ ප්‍රධානියා වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරුන් හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එක් තැනැත්තකු මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතුය.

(5) යම් අංශ ප්‍රධානියකු විශ්‍රාම යෑම, ඉල්ලා අස්වීම හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා ස්වකීය ධුරයේ කටයුතු කිරීමට අපොහොසත්වන අවස්ථාවකදී, අංශ ප්‍රධානියාගේ තනතුර හිස් වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර (1) වැනි ඡේදය ප්‍රකාරව අලුත් අංශ ප්‍රධානියකු පත්කරනු ලැබිය යුතුය.

22. (1) (අ) කෘෂි - ව්‍යාපාර සහ කර්මාන්ත කුටි ;

(ආ) විද්‍යාත්මක උද්‍යාන ; සහ

(ඇ) දීර්ඝ කරන ලද වැඩසටහන්

පිළිබඳව මධ්‍යස්ථාන තිබිය යුතුය.

(2) සෑම මධ්‍යස්ථානයකට ම, ආයතනයේ ගුරුවරුන් අතරින් මණ්ඩලය විසින් පත්කරන ලද සම්බන්ධීකරණ නිලධාරීන් සිටිය යුතුය.

23. ආයතනයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂය විය යුතුය.

24. (1) ආයතනයට අරමුදලක් තිබිය යුතු අතර පහත සඳහන් දෑ එම අරමුදලට ගෙවනු ලැබිය යුතුය :—

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුව ආයතනයට ගෙවිය යුතු සියලු ගාස්තු ;

(ආ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සහ ආයතනයට කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කරනු ලබන සියලු මුදල් ;

(ඇ) ආයතනයේ අභ්‍යන්තර හෝ දීර්ඝ කාලීන කටයුතු සහ සේවා තුළින් උත්පාදනය වන සියලු මුදල් ;

(ඈ) උරුමයන් මගින් උපචිතවන සියලු ආදායම් ; සහ

(ඉ) වෙනත් ඕනෑම ප්‍රභවයකින් ආයතනයට උපචිතවන සියලු මුදල්.

(2) යම් උචිත ආදායම් ශීර්ෂ යටතේ වර්ග කරන ලද යම් නිශ්චිත මාසයක් ඇතුළත අරමුදලට ගෙවන ලද සියලු මුදල්වල ලුහුඩු විස්තරයක්, ඉදිරියේ දී එළඹෙන මාසයට පෙරාතුව අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) ඉහත එක් එක් ප්‍රභේදවලින් ලැබෙන ආදායම වෙන වෙනම ගණනය කරනු ලැබිය යුතුය.

25. (අ) යම් උචිත සාධන පත්‍රයක හෝ මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන විධිවිධානවලට අනුව සහ ආකාරයට ආයතනයේ ගිණුම් පවත්වාගෙන යෑම ;

(ආ) අරමුදලට ගෙවන ලද සියලු මුදල් සහ නිසි ගිණුම් ශීර්ෂවලට බැර කරන සියලු මුදල් ලබා ගැනීම ;

(ඇ) සියලු බලයලත් ගෙවීම් කිරීම ; සහ

(ඈ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඇස්තමේන්තු මණ්ඩලය විසින් සකස් කිරීම සහ ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික මුදල් විසර්ජන සකස් කිරීම

අධ්‍යක්ෂවරයාගේ බලතල වන්නේ ය.

එසේ වුව ද, විශේෂ අරමුණු සඳහා ලැබෙන ප්‍රතිපාදන හෝ විශේෂ අරමුණු සඳහා උරුමයන්ගෙන් ලැබෙන ආදායම් යන ආදායම් ආයතනයේ ගිණුම්වල වෙනම ගණනය කරනු ලැබිය යුතු අතර එකී ප්‍රතිපාදන හෝ උරුමයන්ගෙන් ලැබෙන ආදායම් පිළිවෙලින් සඳහන් ආයතනයේ යම් පොදු කාර්ය හෝ යම් කාර්ය නැතහොත් අරමුණු සඳහා හැර, එකී ආදායමෙන් කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතුය.

26.(1) කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චිතව දක්වනු ලබන ආකාරයට නියමිත ආකෘතියෙන් සහ ආකාරයෙන් මෙන්ම එකී නියමිත කරුණු ඇතුළත්ව ආයතනයේ කටයුතු හා සම්බන්ධ වාර්ෂික ගිණුම් වාර්තාවක් සහ සංඛ්‍යාලේඛන ආයතනය විසින් සකස් කරනු ලැබිය යුතුය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ තැබිය යුතුය.

27. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනය හා සම්බන්ධ පනතේ XIII කොටසේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය හා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව යොදාගනු ලැබිය යුතුය.

28. (1) ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව සහ අවශ්‍ය අවස්ථාවල දී කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව පත්කරගනු ලබන නිලධරයන්, ගුරුවරුන් සහ සේවා නියුක්තිකයන්ගෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතුය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලයට, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය හෝ කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලය විසින් පත්කරනු ලබන කාර්ය මණ්ඩලය මුදා හැරීම මගින් සපයනු ලැබිය යුතුය. ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම සම්බන්ධයෙන් පනතේ X වැනි කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(3) විශ්වවිද්‍යාලය විසින් ස්වකීය නිලධරයකු, ගුරුවරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය කිරීම සඳහා පූර්ණ කාලීනව මුදාහරිනු ලැබ ඇති අවස්ථාවක, ආයතනය විසින් විශ්වවිද්‍යාලයේ සාරානුකූල තනතුරෙහි වැටුප් සහ දීමනා ඔහුට ගෙවනු ලැබිය යුතුය. වෙනත් අවස්ථාවල දී, විශ්වවිද්‍යාලය විමසා නිශ්චය කරනු ලබන සහ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන දීමනා ආයතනය විසින් අදාළ නිලධරයා, ගුරුවරයා හෝ වෙනත් සේවා නියුක්තිකයන්ට ගෙවනු ලැබිය යුතුය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය, අධ්‍යක්ෂවරයාගේ විධානයට සහ විනය පාලනයට යටත් වන්නේය.

(5) ආයතනයේ කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට අදාළ විනය රීති සහ කාර්ය පටිපාටිවලට යටත් වන්නේය.

29. ආයතනයේ අභ්‍යන්තර උපාධි අපේක්ෂක සිසුන් සඳහා ආයතනයට ශිෂ්‍ය සුභසාධන සමිතියක් තිබිය යුතුය. ආයතනයේ ශිෂ්‍ය සුභසාධන සමිතියට හා ඒ හා සම්බන්ධයෙන් පනතේ XIV කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

30. ආයතනය විසින් සාදනු ලබන උපකාරක නීති, නියෝග සහ රීතිවලට හා ඒ හා සම්බන්ධයෙන් පනතේ XIX කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

31. ආයතනයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු පැවතීමේ හේතුව නිසා හෝ එම සාමාජිකයන් පත්කිරීමේ යම් දෝෂයක් හෝ දෝෂ තිබීමේ හේතුව නිසාම පමණක් ආයතනයේ කිසිම ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ කාර්ය සටහනක් බලරහිත නොවිය යුතුය.

32. යම් තැනැත්තකු යථාපරිදි තෝරා පත්කරගෙන, පත්කරගෙන, නම්කර හෝ සම්බන්ධ කරගෙන ඇත් ද යන්න පිළිබඳව හෝ යම් තැනැත්තකු ආයතනයේ යම් අධිකාරියක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක සාමාජිකයකුවීම සඳහා හිමිකමක් ඇත් ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් ඇති වූ අවස්ථාවක දී එම ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේය.

33. මේ නියමාවලිය යටතේ විධිවිධාන සලස්වා නොමැති යම් යෝජනා සම්මත අවස්ථා සඳහා, කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත අවශ්‍ය පියවර ගනු ලැබිය හැකිය.

34. මේ නියමාවලිය ක්‍රියාත්මකවීමට පෙරාතුවම වූ දිනයේ දී පැවති මාගම්පුර කෘෂි - තාක්ෂණික සහ ප්‍රජා මධ්‍යස්ථානය, එම මධ්‍යස්ථානය අහෝසි කිරීමට පෙරාතුව ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් අහෝසි කරනු ලැබේ.

35. මේ නියමාවලියේ—

"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

"උචිත සාධන පත්‍රය" යන්නට පනතේ ඇති අර්ථයම තිබිය යුත්තේ ය ;

"අතුරු නීති" යන්නට පනත යටතේ සාදන ලද අතුරු නීති අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නට පනතේ 24 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ප්‍රකාරව වූ ආයතනයක් අදහස් වේ ;

"ගුරුවරයා" යන්නට පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ;

"සනාතන සභාව" යන්නෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අදහස් වේ.

10-796

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.